**පදවිය ප්‍රාදේශීය සභාව - 2023**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පදවිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු බිල්කිරීම රු.828,333 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.733,000 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.1,344,833 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.749,500 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ට්‍රැක්ටර ආදායම රු.694,000 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.378,500 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් ධීවර ඔරු මට්ටක්කුලියේ සිට සභාව වෙත ප්‍රවාහනය කිරීම සඳහා ලැබුණු රු.290,000 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දෙවතාවක් ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.290,000 කින් වැඩිවී තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර බිල්කිරීම රු.215,200 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.180,450 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | වසා දැමූ ව්‍යාපාර ලේඛනයෙන් ඉවත් කිරීම නිසා මෙම වෙනස සිදුවී ඇති බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත බදු බිල්කිරීම රු.157,200 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.86,000 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර බදු බිල්කිරීම රු.1,571,000 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.1,414,530 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| වියදම් අයිතම 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව වටිනාකම රු.1,219,429 ක් වුවත් උපලේඛන අනුව වටිනාකම රු.960,167 ක් වුයෙන් රු.259,262 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා උපලේඛන සමඟ සැසඳිය යුතුය. |

## 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | ලැබිය යුතු බලපත්‍ර ගාස්තු | 48,000 | (i) විස්තරාත්මක උපලේඛන<br>(ii) කාල විශ්ලේෂණය | ඉදිරියේදී කාල විශ්ලේෂණ සහිත උප ලේඛන ඉදිරිපත් කරන බව. | තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | ලැබිය යුතු කර්මාන්ත ශාලා බදු | 44,400 | -එම- | -එම- | -එම- |
| (iii) | ලැබිය යුතු ව්‍යාපාර බදු | 597,400 | -එම- | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු. 6,023,366 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.5,023,369 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,000,200 | 1,710,630 | 1,673,830 | 641,800 | 1,655,600 | 1,495,450 | 1,533,900 | 605,000 |
| (ii) | කුලී | 11,881,400 | 4,744,337 | 4,737,687 | 455,250 | 6,391,400 | 3,899,085 | 3,465,685 | 448,600 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 5,108,800 | 1,558,349 | 1,724,991 | 48,000 | 3,367,500 | 1,864,352 | 1,692,960 | 214,642 |
| (iv) | වෙනත් ආදායම් | 16,893,600 | 9,302,156 | 8,139,874 | 2,539,777 | 8,742,500 | 7,822,602 | 7,697,834 | 1,377,495 |
| | | 35,884,000 | 17,315,472 | 16,276,382 | 3,684,827 | 20,157,000 | 15,081,489 | 14,390,379 | 2,645,737 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| ව්‍යාපාර බදු රු.597,400 ක් හා කර්මාන්ත බදු රු.44,400 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) **කුලී**

| | | |
|---|---|---|
| 2022 සහ 2023 වර්ෂවලදී සභාව සතු JCB යන්ත්‍රය කුලියට ලබාදීම වෙනුවෙන් අයවිය යුතු කුලි රු.426,250 ක් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.48,000 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඈ) **වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | ජල ගාස්තු රු.117,626 ක් හා ජල සම්බන්ධතා ගාස්තු රු.25,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම හිඟ මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වෙන බව. | -එම- |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,044,197 ක් හා මුද්දර ගාස්තු රු.742,500 ක් අයකරගෙන නොතිබුණු අතර 2022 හා 2023 වර්ෂවල මුද්දර ගාස්තු ආදායම් තහවුරු කරගෙන ද නොතිබුණි. | 2024 පෙබරවාරි මාසයේදී උසාවි දඩ රු.600,454 ක් සහ මුද්දර ගාස්තු රු.7,000 ක් ලැබී ඇති බව හා ඉතිරි මුදල් ඉදිරි කාලයේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ප්‍රකාශයට පත් කරන අතුරු ව්‍යවස්ථා වැලඳගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ තිබෙන පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගැනීම සඳහා 2023 වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පිළිගන්නා බව. | වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකරගත යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ මාස 04 ක කාලය තුළ සභාව ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු.2,262,620 ක් ගෙවිය යුතුව තිබුණු නමුත් එම මුදල් ගෙවීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාලයේදී කොටස් වශයෙන් ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව. | කොටස් වශයෙන් හෝ ගෙවා නිමකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 සහ 2022 වර්ෂවල සභාවේ විගණන කටයුතු කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු රු.319,185 ක විගණන ගාස්තු ගෙවීමට සභාව කටයුතු කර නොතිබුණි. | හැකි ඉක්මනින් ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව. | ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වසර 02 ත් 08 ත් කාලයක සිට පැවත එන පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබිය යුතු රු.2,490,958 ක ණයගැති ශේෂය සහ රු.5,519,377 ක ණයහිමි ශේෂය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට පැවත එන මෙම ශේෂ විස්තරාත්මක වාර්තාවක් සකස් කර නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.5,834,450 ක් වියදම් කර ධීවර ඔරු 34 ක් මිලදීගෙන තිබුණු නමුත් එම ධීවර ඔරුවලින් 30 ක්ම ආදායම් උත්පාදනය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව සභා පරිශ්‍රයේ තිබුණි. | ඔරු සඳහා ඇප තැන්පත් මුදලක් ලබාදීමට ධීවරයින් එකඟ නොවීම නිසා ඔරු ලබාදීම ප්‍රමාද වූ අතර ඉදිරියේදී පරිපාලන කමිටු තීරණයක් ලබාගෙන සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම්ගතව ලබාදී ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණයේදී සමීක්ෂණ මණ්ඩලය විසින් අපහරණය කිරීම සඳහා නිර්දේශ කර තිබුණු භාවිතා කිරීමට නොහැකි පරිදි දිරාපත්වී තිබුණු කැබ්රථයක්, යතුරු පැදියක්, අත් ට්‍රැක්ටරයක් සහ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය ලබා ගැනීමට නොහැකි වීම නිසා අපහරණය කිරීමට නොහැකිව තිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශයක් ලබාගෙන ඉදිරි කාලයේදී අපහරණය කිරීමට කටයුතු කරන බව. | අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |